මහජන බැංකුව | மக்கள் வங்கி

PEOPLE'S BANK

# ටෙන්ඩර් දැන්වීමයි.

## මහජන බැංකුව සඳහා බාහිර ආයතන හරහා ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේ ටෙන්ඩරය (2026/2028)

## ටෙන්ඩර් අංකය P-145/2026

2026.10.01 දින සිට 2029.09.30 දින දක්වා මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලය හා ඒ අවට පිහිටි දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ ඊට අයත් ශාඛා සඳහා බාහිර ආයතන හරහා ආරක්ෂක සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක ආයතනයන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | ප්‍රධාන කාර්යාලය හා ඒ අවට දෙපාර්තමේන්තු | 14. | මාතලේ ප්‍රාදේශිකය |
| 2. | අම්පාර ප්‍රාදේශිකය | 15. | මාතර ප්‍රාදේශිකය |
| 3. | අනුරාධපුරය ප්‍රාදේශිකය | 16. | මොණරාගල ප්‍රාදේශිකය |
| 4. | බදුල්ල ප්‍රාදේශිකය | 17. | නුවරඑළිය ප්‍රාදේශිකය |
| 5. | මඩකලපුව ප්‍රාදේශිකය | 18. | පොළොන්නරුව ප්‍රාදේශිකය |
| 6. | ගාල්ල ප්‍රාදේශිකය | 19. | පුත්තලම ප්‍රාදේශිකය |
| 7. | ගම්පහ ප්‍රාදේශිකය | 20. | රත්නපුරය ප්‍රාදේශිකය |
| 8. | හම්බන්තොට ප්‍රාදේශිකය | 21. | ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය |
| 9. | යාපනය ප්‍රාදේශිකය | 22. | වන්නි ප්‍රාදේශිකය |
| 10. | කළුතර ප්‍රාදේශිකය | 23. | කොළඹ උතුර |
| 11. | මහනුවර ප්‍රාදේශිකය | 24. | කොළඹ දකුණ |
| 12. | කෑගල්ල ප්‍රාදේශිකය | 25. | කොළඹ නැගෙනහිර |
| 13. | කුරුණෑගල ප්‍රාදේශිකය | 26. | කොළඹ බටහිර |

**වෙනත් කොන්දේසි :-**

1. ටෙන්ඩර් අයදුම්පත් 2026.04.24 දින සිට 2026.05.12 දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා අංක:30/101, කිව්පාර, කොළඹ 02 පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩරය වෙනුවෙන් රු. 5,000/- ක ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවිය යුතුය.

2. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත සමග ටෙන්ඩරයේ වාර්ෂික ඇස්තමේන්තුගත පිරිවැයෙන් 3% ක වටිනාකමකින් යුත් ලංසු ඇපකරයක් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගෙන ඉදිරිපත් කළයුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා දින 180 කට වලංගු බැංකු ගෙවීම් ඇණවුම් හෝ අණකර ඉදිරිපත් කළහැකි අතර , පුද්ගලික චෙක්පත් බාරගනු නොලැබේ. මහජන බැංකුවේ ඕනෑම ආකාරයක ගිණුමක මුදල් ස්වරූපයෙන් ඇති තැන්පතුවක් හා ඊට අදාල හිලව් ලිපියක් වුවද ලංසු බැදුම්කරයක් ලෙස පිළිගත හැක.

3. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2026.05.14 දින ප.ව. 2.00 ට හෝ ඊට ප්‍රථම මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව, නො. 30/101, කිව් පාර, කොළඹ 02 ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. 2026.05.15 දින ප.ව.2.00 ට ටෙන්ඩර් වසනු ලබන අතර, එදින ප.ව. 2.00 න් පසු ලැබෙන ටෙන්ඩර් පත් විවෘත නොකරම ආපසු බාරදෙනු ලැබේ.

4. ඉහත ටෙන්ඩරය සම්බන්ධව කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් 2026.05.13 දිනට හෝ පෙර ලියාපදිංචි තැපෑලෙන් ප්‍රධාන කළමනාකාර, සැපයුම් දෙපාර්තමේන්තුව වෙත හෝ විද්‍යුත් තැපෑලෙන් **(supplies@peoplesbank.lk)** යොමු කරන මෙන් ඉල්ලා සිටිමු.

5. පෙර ලංසු කැඳවීමේ රැස්වීම 2026.05.08 වන දින පෙ.ව 10.00 සැපයුම් දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී පැවැත්වේ.

6. සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය මහජන බැංකුව සතුය. අවම මිල පිළිගැනීමට බැංකුව බැඳී නොමැත.

7. මේ පිළිබඳ වැඩි විස්තර ප්‍රධාන කළමනාකාර (සැපයීම්) වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ද ලබාගත හැකිය.


ප්‍රධාන කළමනාකාර (සැපයීම්)<br>
මහජන බැංකුව,<br>
සැපයීම් දෙපාර්තමේන්තුව<br>
නො. 30/101, කිව් පාර, කොළඹ 02

| | |
|---|---|
| දුරකථන අංක | : 2439577/8, 2307326 |
| ෆැක්ස් | : 2439576 |
| වෙබ් අඩවිය | : www.peoplesbank.lk |
| ඊ මේල් | : supplies@peoplesbank.lk |